# 22

නිර්මලාගෙන් හා එඩ්නාගෙන් සමුගත් බිමල් කැලෙන් එක අසලින්ම බස්රියකට ගොඩවුනේය. වෙලාව රාත්‍රී නමයට ආසන්න විය. වඩාත් සෙනඟ-නොවූ බස්රියේ ඔහු වම්පස කවුළුවක් අසල හිඳ ගත්තේය.

පසු කරමින් ගිය වා හැම සිසිල් විය. කවුළුවෙන් පිටත අඩ අඳුරේ වරින් වර ගොඩනැගිලිවලින් නිකුත් වන විදුලි ආලෝකය බිමල්ගේ නෙත ගැටුණි.. ගගසිරි හෝටලයට ලංවන්නම ඔහු නොළුම් බලා සිටියේය. කාමරය තුළ නල විදුලි එළිය සුදු නිල් පැහැයකි. ඇතුළත මිනිසුන් කීප දෙනා සෙවනැලි මෙනි. සෝමෙන් ආපනේට කෑම කරනවා ඇති. හෝටලයේ රූප රාමුව හරියටම කැරකෙන භාෂ් කැඩුවක මූණක මෙන් බිමල්ව පසු කරගෙන පසු අතට ගියේය. ඔහුගේ නෙතට නැසුණු දසුන පසු විය. කන්වර කීපයක් වමණි. කාන්තා ආත්තම්ම ටිපියක් ලියුවේ මෙතැන මුදන්...! තමා බස්රියක හිඳ ඒ දෙස බැලුවේ ඔහුම තලයක රෙදෙන සූනයෙක විලසින්!

බස්රියෙන් බැස ගත් බිමල් අතුරු පාර දිගේ ඩයස් මාවතට පයින්ම ගමන් ගත්තේය. ඉදෑ-හිට බල්ලෙකුගේ බිරුම් හඬක් ඇසුණු රාත්‍රිය ගාඩ් විය.

දෙමහල් ගොඩනැගිල්ලේ ගේට්ටුව වෙතට ඇවිත් බිමල් තම දුරකථනයෙන් මේසාට කතා කළේය.

"ගේට්ටුව ඇරල තියෙන්නෙ- එන්න" ඈ හෙමින් මෙන් කීවාය. "ඇල්ෆි හිටියට ගානක් ගන්න එපා- දැක්කොත් මං බලන්න එනව කියන්න. ගේට්ටුව වහගෙන එන්න- හොඳේ?"

"හොඳයි."

බිමල්ගේ පපුව ගැහි ගැහි හා ගැහෙන්නට විය. මේසා- මේසා- මේසා- ඔහුගේ හදවත කියන්නා සේය. ගේට්ටුවේ කුඩා දොරටුව ඇරගෙන වත්තට ඇතුළු වූ ඔහු දොරටුව වසා ගෙය අතට ඇදුණේය. සාලයේ විදුලි පහනක එළිය වීදුරු කවුළුවලින් පිටතට කාන්දු විය. ඒ ඇරෙන්නට

ඉස්තෝප්පුව අඳුරු විය.

බිමල් ඉහළ මාලයට නැගෙන පඩිපෙළට ළං වෙත්ම ඉස්තෝප්පුවේ මුල්ලක සිට ඇගෙයෙකු මෙන් මතු වූයේ ඇල්ලිය. ඇයගේ සුදු සරමත් බැනියමත් අඩ අඳුර අතරින් කැපී පෙනුනද ඇයගේ අඳුරු මුහුණෙන් පෙනුනේ ඇස් වල සුදු පමණි.

බිමල් යමක් කියන්නට පෙර ඉහළ මාලය අතට ඇඟිල්ලක් දිග කරද්දී ඇල්ලි "හාං" කියා යළි අඳුරට ඇදුනේය.

'මේ මිනිහට මෙහෙම මෙතැනට ද යානෙ මිනිස්සු යනව එනව දැකල පුරුදු ඇති' බිමල් පඩි පෙළ නගින අතරේ සිතුවේය.

ඔහු ඉහළම පෙත්තට නගින විට මේසා දොර හැරියාය. ඇතුලතින් ආ කහ පැහැ විදුලි එළිය ඇගේ හිස වටා රැස් මාලාවක් මැවීය. ඇගේ කෙස් කැරලි අග තඹ පැහැයක් ගති. ඇගේ මුහුණේ අඩකට එළිය වැටුනි. ඇගේ වත්සුනු සුවඳ ඔහුගේ පෙණහැලි පුරවා ගත්තේය.

"එන්න" කී ඇය ඔහු ඇතුල්වූ සැනින් ඉදිරි දොර වසා දැමුවාය.

දෙදෙනා මද වේලාවක් එකිනෙකාගේ දෑස් තුළ පිළිතුරු සොයන්නාක් මෙන් මුහුණට මුහුණ බලා සිටියහ.

"ඉතිං?" ඇගේ දෙතොල් කොතරම් පිරී ඇද්ද?

තමා ඇත්තෙන්ම ඇයට මේ තරම් සමීපව සිටියේ මේ මොහොතේය. කොතරම් ආකර්ශනීයද?

"ඉතිං?" ඔහු කීය.

ඇය ඔහුගේ ගමන් මල්ල පිටෙන් ඉවත් කරන්නට උදව් කරද්දී ඇගේ සුවඳ ඔහුට වඩාත් දැනුනි.

"ඉඳ ගන්න- කෝපි එකක් බොමුද? උණුවට?"

"හාං"

"කාලද?"

"ඔව්"

"මං ඩිනර් එකකට ගිහින් ආවෙ"

"කිව්ව නෙ -"

සුව අසුනක හිඳගත් බිමල් වට පිට බැලූවේය. මේ තට්ටු ගෙය එක දිග සාලාවක් මෙනි. දෙරෙම් දිගැටි වූ ඈත විසිත්ත කාමරයක් මෙන් කොටස. ඊළඟට දෙපෙළේ දකුණට බෝක්කුවෙන් එහා කෑම මේසයක් සහිත කුඩා කුස්සිය. ඊළඟට කාමරයෙකින් එහා නිදන ඇඳ සහිත කොටස. එයින් එහා වූ නාන කාමරය වෙනමක් නූතන බිත්තියකින් වෙන් කර තිබිණි.

මේ නිවහනේ සියලු බඩු භාණ්ඩ නවීන හැඩයේ වීය. විදුලි ආලෝක ආවරණ පවා, එලොවකින් පහත් වූ අසාමාන්‍ය කාශ යාන මෙන් විජිත්‍ර ප්ලාස්ටික් වලින් තනා විය. බිත්තියේ රතු පාට වර්ණ, කළු රේඛා, මුළු පරිසරයමම චමත්කාරයක් එක් කරයි.

විසිත්ත කාමරයේ, ප්‍රධාන දොරට විරුද්ධ දිශාවේ ඇති යෝධ ප්‍රමාණ කවුළුව වසා ගත් දිගු ලේ තිර රෙදිවලට ඔබ්බෙන් සඳළු තලයක ගරාදි මුව යන්තම් දිස්විය.

"මේ ගෑනිට මෙහෙම තැනක ඉන්න සල්ලි කොහින්ද ?" බිමල්ට සිතුණි.

"ඉන්න මං කෝපි එකක් හදන්න" කියමින් මේසා කුස්සිය අතට ගියාය.

ඇය ඇඳ සිටියේ දිලිසෙන රතු සිල්ක් ලෝඩිං ගවුමකි. ඇය ඇවිද යද්දී ගවුමේ සාය කොටස නැළැවිණි. යම් කිසි ආකල්පයක් බිමල්ට වසා ගත්තේය.

ඇය තමාට කලින් කළ විහිළුව හෝ සෙල්ලම තිබුණා නොවේ නම් තමාට සම්බර වීම අද රෑ මෙතැන්ට එන්නට ඉඩ නොලැබෙන්නට තිබිණි. ඇය ක්‍රියා කළේ කොයිතරම් සූක්ෂම ආකාරයෙන්ද ? ඊළඟට තමාට මෙතැනට එන්නට ඇකිළියි බලන්නට මෙන් ඇය තමාට කඩොලු ඇම්මේ හරගයකුත් තිබ්බ, නොවේද ? තමා, හැල උපාදුවක් නොවී නම් - ඇය තමාට ඒ මොහොතේම අවතක කර දමාවි. එසේ නම් තමා ඒ අත්හොඳ විදිනා ඒ අභිබවා ආවා නොවේද ? මධ්‍ය කාලීන යුගයේ සෙබළුන් දුවන ගෝත්‍රිලව් කඩුළු පිමා අතරින් තමා දුව ආවා සේය

බිමල්ට හැඟුණේ.

මේසා තම තැටි වාදකයෙන් සිහින් සංගීතයක් ඉස්මතු කළාය. මුළු ගෙය පුරාම ඒ බටහිර සම්භාව්‍ය නාද රටා ලාවට ගලා ගියේය. බිමල්ට සිතුණේ තමා හොලිවුඩ් චිත්‍රපට රාමුවකට ඇතුල් වූනාක් සේය. මෙය ඇත්තෙන්ම - සිහිනයක්ද?

ඇත්තක් සිහින වන්නේ කොහොමද? සිහිනයක් ඇත්ත වන්නේ කොහොමද? මෙය නම් තමා සිහිනෙකින්වත් සිතූ දෙයක් නොවේ.

"අපිට හරි හැටි කතාකරන්න හම්බ උනෙත් නෑ-නෙ නේද?" කෝපි හැඳීමෙන්නට හැදූ මේසා අවුත් බිමල් අසලින්ම හිඳ ගත්තාය. "ඉතිං?"

"ඉතිං ඔයා 3 වල ගියා - නමුත් කිව්වෙ නෑ-නෙ?"

"දැන් දන්නවනෙ?"

"ඔව් - මේසා!"

"හරි -" කී ඇය සිනාමුසු වූවාය. හඬ නගා සිනාසුණාය.

"ඇයි එහෙම 3 වල ගියෙ?"

"බස් එක ආවා - මං නැග්ගා. මං හිතුව ඔයත් නැග්ගා කියලා. බලන කොට - ඔයා නෑ"

"මං සපත්තු ගන්න ගියා."

"කමක් නෑ - ඒකායි මං දඩිබිඩි ගාලා කාඩ් එක විසි කළේ."

"හොඳ වෙලාවට."

"ඉතිං අපි ආයෙ මුණ ගැහුණානෙ නේද? දැන් කාගෙන්වත් කරදරයක් නෑ අපිට."

"ඔයාගෙ තව යාළුවෙක් - මී යෙහෙළියක් ඉන්නව කිව්වනෙ?"

"එයා ඉන්නෙ අනික් කෑල්ලෙ, කොරිඩෝරෙන් අනිත් පැත්තෙ. තාම ඇවිල්ල නෑ එයා."

"මේසා මොනවද කරන්නෙ?"

"මොඩලිං"

"මොඩලිං?"

"ඔව් උඹලා - ඇඳුම්වලට විසින් - මොඩලිං" කී ඇය "ඉතිං ඔයා?" කියා ඇසුවාය.

"මං යුනිවසිටි යන්න ලැස්ති වෙනවා"

"බේ - බී!" ඈ සිනාසුනාය. "ඔයා තවම පොඩි බබෙක් නෙ"

"ඇයි එහෙම කියන්නෙ?"

"නෑ - නෑ - සොරි - සොරි - ඉන්න මං කෝපි අරන් එන්න. කිරි? සීනි?"

"කිරි එපා - සීනි හැදි දෙකක්."

"ඕ. කේ." කී ඈ යළි නැගිට ගියාය.

කෝපි බඳුන් දෙක ගෙනවුත් කෝපි මේසය මත තැබූ ඈ "ඉතිං බිමා ඔයා තනියම බෝධිය වන්දනා කරන්න ආව කාරණේ කිව්වෙ නැද්දනෙ?" කීවාය.

"බිමා!" ඈය තමාට අමතන්නෙ බිමා කියලා - බිමල් නෙමෙයි බිමා - හරියට බිම දැම්මා වගේ!

"මං ආවෙ - බාරයක් ඔප්පු කරන්න. විභාගෙ හොඳට තැනට" බිමල් කීවේ බොරවුනි.

"කව බාරයක් උනා කීවෙ?"

"බාර වෙන ඒවා සද්ද කරල කියන්න හොඳ නෑ නේද?"

"ඒ මොකද්ද ඒ කතාව? භාරයක් කියන්නෙ ප්‍රාර්ථනාවක් නෙමෙයිනෙ බිමා!"

"ඕක හරි - මං බාර වුනේ, අම්මට සනීප වෙන්න"

"අනේ!"

"ඔව් අම්මට ටිකක් සනීප මදි."

"අනේ! කොච්චර හොඳ පුතෙක්ද ඔයා?"

කී ඈ එක්වරම අත දිගු කර බිමල්ගේ හිස කෙස් අතගෑවාය. බිමල්ගේ ගත පුරා, විදුලි සරයක් දුව ගියේය. කොයි තරම් පහසක්ද?

ඔහුගේ ඇසට කඳුලක් නැගුණි.

"එතකොට ඔයාගෙ තාත්තා?"

"තාත් - තා?" කී ඔහුට උගුර හිරවෙනු දැනුණි. තවත් කඳුලක් ඇසෙන් මතුවී කම්මුලට හැලුවේය.

"අනේ!" කී මේසා බිමල්ගේ කඳුල පිසදැම්මාය

"මේ මොකද? තාත්තා නැද්ද? ඔයාගෙ?"

"නෑ!" කී බිමල් එක්වරම තම හිස ඇගේ

ළැමැදට පාත් කළේය.

ඇය ඔහුගේ හිස තවත් තම ළැමට තුරුල් කර ගත්තාය. තමා ජීවිතයේ මෙතෙක් නොලද සැනසුමක් නොවේද මෙය? තම කම්මුලෙහි වැදුන ඇගේ ළැම සම කොතරම් මට සිලිටුද? ඇය හැඳ සිටින සේද ගවුමේ සුමුදු බව පරයන සුමුදු බවක් ඒ සමෙහි වෙයි.

බිමල් මද වේලාවක් ඉකි බිඳ ඇඬුවේය. තමා තාත්තා සොයා යන ගමනක් ගැන ඇයට කෙසේ කියන්නද? තමා අද සොයා ආවේ ඒ සඳහා නොවේ. තමාට ඇගේ අනුකම්පාවක් අවශ්‍ය නොවේ. තමා කුඩුල් පෙලන උදරයෙක් වුනොත් - ඇය තමාට දරුවෙකුට මෙන් සලකා යන්නට හරිවි.

බිමල් ඇගේ ළැමෙන් හිස ඉවතට ගෙන කලිසම් සාක්කුවෙන් ගත් ලේන්සුවෙන් ඇස් පිසදා ගත්තේය. මෙසා ඔහුට 'අවශ්‍ය නැති' කියා ටිසියු පිස්නා කඩදාසි වෙට්ටියක්ම ඔහුට ලං කළාය.

"කෝපි එක බොන්න බිමල් - නිවෙන්න කලින්."
මේ වතාවේ ඇය කීවේ බිමල් කියායි. බිමා නොවේ. දැනටම ඇගේ හිත වෙනස් වෙලාද?

"මේ අපි ඕවා ගැන කතා නොකර ඉමු." කෝපි උගුරක් තොල ගා බිමල් ස්වර නඩකින් කීවේය. "ඔයාගෙ පවුලෙ තොරතුරු මට කීවෙ නැහැනෙ?"

"මොනව කියන්නද? මට පවුලක් - නැහැ" ඇය සුසුමක් හෙළුවාය. "එක අක්කියෙක් ඉන්නවා, ඔස්ට්‍රේලියාවෙ"

"ඉතිං ඔයාට එහේ යන්න ආසාවක් නැ?"

"අපෝ ගිහිං තියෙනවා. අක්කි බැඳල ඉන්නෙ සුද්දෙක් -"

"ඔයාට කිට්ටු නැහැ - වගේ."

"ඒක අක්කිගෙ කැමැත්තනෙ නේද? ඒගොල්ලො හැපී --"

"ඔයාගෙ අම්මා තාත්තා?"

"ඉන්නව නෑ. මට අම්මෙක් වගේ ඉන්නෙ ආන්ටි හිල්ඩා - මගෙ සිස්ටර් වගේ ඉන්නෙ - ලෙක්සි."

"ඔයාගෙ යෙහෙළිය?"

"හරියට හරි." ඈ සිනාසී කෝප්පි තොල ගෑවාය.
"එයා එන්න ඇති වෙයි. ඔයා බාත් එකක් දාගන්නවද?"

"හා"

"කෝප්පි එක බීල ඉන්න. ටූත් බ්‍රෂ් ටූත් පේස්ට් ගෙනාවද?"

"නෑ"

"හරි ළමයා! ඉන්න මගෙ ළඟ අලුත් ටූත් බ්‍රෂ් තියෙනවා."

"තෑන්ක් යූ." කී විමල් ඉක්මනින්ම කෝප්පි බඳුන හිස් කළේය. කෝප්පි දියරය ඉතාමත් උත්තේජනීය පානයක්ම විය. ඒ උත්තේජනය විමල්ට සිරුර පුරාවට දැනුණි.

"විමා - උණුවතුරත් තියෙනවා. ඕන නං" ඈ යළිත් තමාට 'විමා,' යැයි ඇමතීම විමල්ට සතුටට කාරණා විය.

"තෑන්ක් යූ."

"කම් - එන්න" කී මේසා දෑතම දිගු කොට විමල්ව නැගිට්ටෙව්වාය.

නැගිට ගමන් විමල් ඇයව තුරුළු කොට ගත්තේය.

"බාත් එකක් දාලා එන්න" කී ඈ ඔහුව නාන කාමරය වෙත කැඳවා ගියාය.

එහි යාමට සයනය පසු කළ යුතුවිය. එය සීරුවට සකසා තිබිණි. විල්ලුද වන් ලා කහ පැහැ ඇතිරිලි. සයනය අසලම මන්දාලෝකය විහිදුවන නැඹිලි පැහැ විදුලි ආවරණයක්.

විමල් එයින් ඔබ්බෙහි නාන කාමරයට වැදී ඇඳුම් ඇඟලුම් උනා උණුසුම් වතුර විසිරෙන වතුර මල යට සිට හිතේ හැටියට නා ගත්තේය. අනතුරුව පෙරදින ගෙන ආ සරම පමණක් දවටා ගෙන නාන කාමරයෙන් පිටතට ආවේය.

ඒ එනවිට මේසා ඇඳ ඇතිරිලි මත අපේක්ෂාවෙන් බලා සිටියාය.

සිහින් සංගීතය නැගී තිබිණි.